බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

01.සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.) — යොමු අංකය: පළාත්/ඉකො/ප්‍රකස/ආ1/2/5 — දිනය: 2018.02.05

1.2 අමාත්‍යාංශය : කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය (බ.ප.) — යොමු අංකය: කෘ/ආස/x/1/22-2018 — දිනය: 2018.02.09

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම — යොමු අංකය: ඩීඑම්එස්/ඩී/පොදු/11-2

දිනය:2012.12.19

1.4 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය : — දිනය :

1.5 ප්‍රධාන ලේකම්(බ.ප.) නිර්දේශය — යොමු අංකය: CSO/PER/12/2/2/1-II — දිනය : 2018. 02. 21

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය: WPC/PSC/ADM/16/4/16 — දිනය : 2018-04-03

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය — යොමු අංකය: — දිනය :

02. පත් කිරීම් බලධාරියා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

- අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය

3.2 ශ්‍රේණි - III ශ්‍රේණිය

II ශ්‍රේණිය

I ශ්‍රේණිය

විශේෂ ශ්‍රේණිය

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : ගව/ADM/4/2/13
දිනය : 2018/4/12

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන රජයේ ඉඩම් රාජකාරී සම්බන්ධයෙන් ජංගම සේවා පැවැත්වීම, ඉඩම් ආරවුල් සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම, ඉඩම් තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම, තිරසාර සංවර්ධනය සඳහා රජයේ ඉඩම් වල යටිතල පහසුකම් ප්‍රවර්ධනයට අදාල ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය යන කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යොෂ්‍යතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : i) III, II, I ශ්‍රේණි - (රා.ප.ච. 03/2016) MN 3-2016

ii) විශේෂ ශ්‍රේණිය - (රා.ප.ච. 03/2016) MN 7-2016

5.2 වැටුප් පරිමාණය :

III ශ්‍රේණිය
II ශ්‍රේණිය } රු. 31,040 –10 x 445 –11x 660 – 10 x 730 – 10 x 750 - 57,550
I ශ්‍රේණිය

විශේෂ ශ්‍රේණිය රු. 41,580 – 11x 755 - 18 x 1030 - 68,425

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | 1 | රු. 31,040.00 |
| II | 12 | රු. 36,150.00 |
| I | 23 | රු. 43,480.00 |
| විශේෂ | 4 | රු. 43,845.00 |

සටහන :- බඳවා ගැනීම්, උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණ සඳහන් කිරීමේදී රා.ප.ච. අංක 03/2016 චක්‍රලේඛයේ උපලේඛණ 1 හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් කළ යුත්තේ, උප ලේඛණ 11 හි සඳහන් පරිදි බැව් පත්වීම් ලිපියෙහි සඳහන් කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ...
දිනය : 2018/4/11

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ජනපද නිලධාරි | III,II,I | 21 | උපලේඛනය 01 |
| | විශේෂ ශ්‍රේණිය | 03 | |

සටහන :- ශ්‍රේණිගත උසස් කිරීමේ කාර්යය සඳහා සේවා ගණයේ III,II,I ශ්‍රේණි සියල්ල, ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- III, II, I - 21

විශේෂ ශ්‍රේණිය - 03

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : ජනපද නිලධාරි III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාව යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

2. සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් -

(i) කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච, පාලමුණේ, නයිවල, පරන්තන් යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ii) අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(iii) ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(iv) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(v) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(vi) ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ

7.2.2.4 කායික සුදුසුකම් :

බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(iv) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (03) තුළ බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(v) සේවයට බඳවාගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිලිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

(vi) බඳවා ගන්නා නිලධාරින් ස්ථාන මාරුවීම් වලට යටත් විය යුතුය. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුල කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම වයස් සීමාව - අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම වයස් සීමාව - අවුරුදු 30 ට නොවැඩි

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : G-3/142/4/2/...
දිනය : 2018/4/12

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

7.2.4.1.1 පවත්වන බලධරයා :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක් විසින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

ලකුණු ලබා නොදෙන අතර, අයදුම්කරුවන් බඳවා ගැනීමේ තරහ විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති බවට සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඊට අමතරව වෙබ් අඩවියේද දැන්වීම් පළ කළ හැකිය.

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාල නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : 605/ADU/14/12/132
දිනය : 2018/4/12

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යනවග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය/පරීක්ෂණය /සහතික පාඨමාලාව /වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය<br>උපලේඛනය 03 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ජනපද නිලධාරි II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය<br>උපලේඛනය 04 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ජනපද නිලධාරි I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :
වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන බලධරයන් කවුද ?

(අ) පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබයි.

(ආ) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි.

සටහන : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.06.01 දිනට ජනපද නිලධාරි I ශ්‍රේණියට උසස් වී වසර (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

09. භාෂා ප්‍රවීනතාවය

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුලදී ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය |
| සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් III වන ශ්‍රේණියේ වසර 5 ක් ඉක්මවීමට පෙර ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා සියළුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහත කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

vi. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

vii. අදාල මට්ටමේ සන්ධාන භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම -01) අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

## 10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

### 10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 1) අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සටහන : සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධරයන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට ප්‍රමාදවූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා වෙත ලැබුණු ලිපි
ගොනු අංකය : ...
දිනය : ...

## 10.3 විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම

### 10.3.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| සීමිත | 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 60% |

සටහන : විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේදී පුරප්පාඩු ගණනය කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

I. අනුමත තනතුරු සංඛ්‍යාව 03 ක් වන විට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% ක් විය යුතුය.

II. විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 03 කට වඩා අඩු වේ නම් නිලධාරින්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත තනතුරු වල පුරප්පාඩු පිරවීම සිදුකල යුතුය.

10.3.2 සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගැනීම

10.3.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහ (05) ම උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.3.2.2 බඳවා ගන්නා ආකාරය

බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනු පිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය උප ලේඛනය 05)

සටහන : i. විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අදාල කර ගත යුතු වන්නේ එම විභාගය අදාල වන්නා වූ වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

ii. වාර්ෂිකව එම විභාගය පැවැත්වීමට හැකි වූයේ නම් ඊට පසු වර්ෂයක පැවැත්වෙන විභාගයේ ප්‍රතිඵල එක් එක් වර්ෂවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම අදාල කරගනු ලැබේ. එහිදී ඒ ඒ වර්ෂ වල පුරප්පාඩු ඇති වූ දිනයන්ට සුදුසුකම් ලැබූ නිලධරයන් ලකුණු අනු පිළිවෙල අනුව තෝරාගනු ලබන අතර, විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය පැවැත්වූ දිනය වේ.

10.3.3. සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවා ගැනීම

10.3.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය(06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයා ගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම.

10.3.3.2 බඳවා ගන්නා ආකාරය

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත් කිරීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විසින් සිදු කරනු ලබයි.

(විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - උප ලේඛනය 06 )

11. තනතුරු වලට පත් කිරීම - අදාල නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
අංකය : ...
දිනය : ...

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද අනුව කටයුතු කල යුතුය.

12.1 පරිවාස කාලය හා සේවය ස්ථිර කිරීම

1. විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධරයෙකු වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. ඔහු / ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු /ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් ඔහු /ඇය පරිවාස කාලය අවසානයේ ස්ථිර කරනු ලැබේ.

12.2 වෘත්තියමය සේවාවල කරනු ලබන උසස්වීම් - අදාල නොවේ

12.3 රජය විසින් හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවයද සියළුම නිලධරයන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

13. අර්ථ නිරූපන

" සතුටුදායක සේවා කාලය"

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින්ද, සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද, සිදු කල යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) සේවකයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩුකොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක්ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

" සක්‍රිය සේවා කාලය"

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

"නියමිත දිනට"

අදාල කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය, "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම් වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරින්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරින්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

"සේවා ව්‍යවස්ථාව"

යන්නෙන් අදහස් කරනුයේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාව වේ.

"ක්‍රියාත්මක වන දිනය"

යන්නෙන් අදහස් කරනුයේ මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ.

ගොනු අංකය :
දිනය : 2013/4/12

14. අන්තර්ග්‍රහණ විධිවිධාන :

14.1 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06 / 2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MN3 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධරයන් සියළුම දෙනා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.2 සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

14.3 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට සේවයේ නියුතු නිලධරයන් නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය යටතේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි තනතුරේ අදාල ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම පහත සඳහන් ආකාරයට සිදු කරනු ලැබේ.

14.3.1. සේවයේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි II වන පන්තිය (ආ) බන්ඩයේ සිටින නිලධරයන්

14.3.2 සේවයේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි II වන පන්තිය (අ) බන්ඩයේ සිටින නිලධරයන්

14.3.3 සේවයේ I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි I වන පන්තියේ සිටින නිලධරයන්

14.3.4 සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි විශේෂ ශ්‍රේණියේ සිටින නිලධරයන්

15. අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන 2018.06.01 දක්වා බල පැවැත්වේ. මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට III වන හා II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරින්ට උසස්වීම් ලබාදීමේදී අන්තර්කාලය තුළදී අදාළ කරගත යුත්තේ මීට පෙර අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ අදාල වගන්ති වේ. (අනෙකුත් කොන්දේසි මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව වේ)

16. වෙනත් :

16.1 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16.2 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධ ගැටළු පැන නගින අවස්ථාවකදී හා / හෝ මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

සකස් කළේ : ................................
ඒ.එල්.පාලිත
කළමනාකරණ සහකාර

පරීක්ෂා කළේ : ................................
කේ.කේ.කේ.ෆොන්සේකා
සහකාර පළාත් ඉඩම් කොමසාරිස්

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන : ........................................
නම : ඒ.ඊ.නිරෝෂා දීපනී
තනතුර : පළාත් ඉඩම් කොමසාරිස් (බ.ප.)
නිලමුද්‍රාව
නිරෝෂා දීපනී ඊශ්වර
පළාත් ඉඩම් කොමසාරිස්
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.)
මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2018.02. 05

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/BD/14/2/133 -
දිනය : 2018/4/12

යොමු අංකය : කා/ආනා/IX/1/22 - 2018

බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි ජනපද නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................................
නම : ........................................
තනතුර :කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.)
නිලමුද්‍රාව

දිනය : 2018 - 02 -

චින්. නිල්වල
ලේකම්
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බස්නාහිර පළාත)
ශ්‍රාවස්ති මන්දිරය,
තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

යොමු අංකය :

බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි ජනපද නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................................
නම : ........................................
ප්‍රධාන ලේකම් (බ.ප.)
නිලමුද්‍රාව

දිනය : 2018/2/21

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය : WPC/PSC/ADM/4/46

බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි ජනපද නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

අත්සන :.......................................................

නම :.......................................................

ලේකම්,

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

නිලමුද්‍රාව

එම්. ජී. ඒ. තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 109, දෙවන මහල
මහ වීදිය, බත්තරමුල්ල

දිනය : 2018.04.10

යොමු අංකය : GOS/WPM/4/7/330

බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි ජනපද නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ...2018/4/12... දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

අත්සන :.......................................................

නම :.......................................................

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

නිලමුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

දිනය : 2018/04/12

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : ...GOS/WPM/4/7/330...
දිනය : ...2018/4/12...

උපලේඛනය 01

<u>බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරට අදාල කාර්යයන්</u>

1. රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ) විධිවිධාන පනත හා බස්නාහිර පළාත් ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය යටතේ කටයුතු කිරීම.

2. රජයේ ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම.

3. ඉඩම් රාජකාරී සම්බන්ධයෙන් ජංගම සේවා පැවැත්වීම.

4. රජයේ ඉඩම්වල යටිතල පහසුකම් ප්‍රවර්ධනය සඳහා පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධයෙන් කටයුතු කිරීම.

5. බස්නාහිර පළාතේ රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මකව පවත්වාගෙන යාම.

6. ජාතික වැඩ සටහන් හා පළාත් මට්ටමෙන් සිදුකරන වැඩ සටහන් වලට පළාත් ඉඩම් කොමසාරිස්ගේ සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත ඊට සම්බන්ධව කටයුතු කිරීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගො.2/149/14/7/3/3/2
දිනය : 2018/4/12

## උපලේඛනය 02

01.විභාගයේ නම :- බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

02.විභාගයේ පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

03.විභාගය පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක්

4.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇති වූ විට

5.විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන බහුවර්ණ ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| 2.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 1.ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයේ දායකත්වය<br>අ) දළ ජාතික නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයේ දායකත්වය.<br>ආ) රැකියා නියුක්තිය<br>ඇ) කෘෂි කර්මාන්තයේ අපනයන ආනයන තත්වය |
| | 2.ශ්‍රී ලංකාවේ දේශගුණික කළාප පිළිබඳ දැනුම |
| | 3.පස සහ ශාක පෝෂණය<br>අ) පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය භෝග වගාව කෙරෙහි එහි බලපෑම.<br>ආ) ශාක පෝෂණය පාංශු / ශාක පෝෂණ කළමනාකරණය.<br>ඇ) පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු. |
| | 4.පාංශු රසායන, පාංශු රක්ෂණයේ වැදගත් කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම |
| | 5.වාරිමාර්ග ක්‍රම හා ජල කළමනා කරණය<br>අ) විවිධ බෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය<br>ආ) ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම<br>ඇ) ජල වහනය හා එහි වැදගත් කම |
| | 6.ගොවිපල යාන්ත්‍රීකරණය<br>අ) ගොවිපල යාන්ත්‍රීකරණයේ වාසි අවාසි<br>ආ) බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>ඇ) ජල සම්පාදන හා පැලෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>ඈ) ඉහත යන්ත්‍ර ක්‍රියා කරවීම හා නඩත්තුව |
| | 7. කෘෂිකාර්මික ව්‍යාප්තිය<br>අ) කෘෂිකාර්මික ව්‍යාපෘති උපාය මාර්ග හා ක්‍රමවේදය<br>ආ) කෘෂිකාර්මික ව්‍යාපෘති සන්නිවේදන ක්‍රම |

| | |
|---|---|
| | 8. පටක රෝපණය<br>අ) පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම<br>ආ) පටක රෝපණයේ භාවිතයන් /යෙදීම් උදාහරණ<br>ඇ) පටක රෝපණයේ වාසි හා අවාසි |
| | 9. පැලෑටි නිරෝධායන පිළිබඳ දැනුම<br>අ) පැලෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම<br>ඇ) පැලෑටි නිරෝධායන ක්‍රම |
| | 10. ශාක සංරක්ෂණය<br>අ) ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක /ජාන ප්ලාස්ම)<br>ආ) ශාක සංරක්ෂණයේ ක්‍රම (ශාක /ජාන ප්ලාස්ම) |
| | 11. ජාන තාක්ෂණය<br>අ) DNA වල වැදගත් කම<br>ආ) ජානය යනු කවරෙක්ද, එහි ක්‍රියාකාරිත්වය<br>ඇ) DNA තාක්ෂණය යොදා ගැනීමේ අවස්ථා<br>ඈ) ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩි දියුණු කිරීමට ඇති හැකියාව |
| | 12. ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම<br>අ) ජනපද ව්‍යාපාරය පිහිටුවා ඇති ස්ථාන<br>ආ) මහවැලි ව්‍යාපාරයට අයත් වන ප්‍රදේශ |
| | 13. ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම |
| | 14. සිතියම් ආශ්‍රිත කරුණු පිලිබඳ දැනුම<br>අ) අනිලමානය, රෝඩ් රේසරය, ඩම්පි ලෙවලය, තියෝඩර් ලයිටරය<br>ආ) 1:50,000–1:10,000අගලේ සිතියම හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර |
| | 15. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිලිබඳ දැණුම<br>ඉඩම් වර්ග<br>රජයේ ඉඩම්, පුද්ගලික ඉඩම්, ප්‍රවේණි ඉඩම් |
| | 16. ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ දැණුම<br>වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ ක්‍රියාත්මක ජාතික වැඩ සටහන් පිළිබඳ අවබෝධය<br>ඉඩම් නොමැති පුද්ගලයින් හදුනා ගැනීම<br>බිම් සවිය වැඩසටහන<br>ඉඩම් කැබලි ලක්ෂයේ වැඩ සටහන |
| | 17. රජ සමයේ සිට මේ දක්වා ඉඩම් වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය<br>අ) සන්නස්, නින්දගම්<br>ආ) බදුකර, ස්වර්ණ භූමි, ජයභූමි, රත්නභූමි, රන්බිම |

අත්සන ..............................................

නම ................... නිරෝෂා දීපනී රශ්වර

තනතුර ........ පළාත් ඉඩම් කොමසාරිස්

නිල මුද්‍රාව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප)
මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2018.02. 02

උපලේඛනය 03

01.විභාගයේ නම : බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02.විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්ණ පත්‍ර 02 කින් සමන්විතය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

03.විභාගය පවත්වනු ලබන බලධරයා :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති<br>ආයතන සංග්‍රහයේ VII, XII, XIII, XIV, XIX පරිච්ඡේද |
| 2. මුදල් රෙගුලාසි | I වැනි පරිච්ඡේද මුදල් රෙගුලාසි 01 සිට 68 දක්වා<br>III වැනි පරිච්ඡේද මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 605/අ.ආ/4/2/3.3.
දිනය : 2018/5/12

අත්සන ..................
නම ..... නිරෝෂා දීපනී ඊශ්වර
තනතුර ..... පළාත් ඉඩම් කොමසාරිස්
නිල මුද්‍රාව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.) මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2018.02. 05

උප ලේඛනය 04

01.විභාගයේ නම : බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02.විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්ණ පත්‍ර 02 කින් සමන්විතය

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII වන පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසි වල පහත පරිච්ඡේද මත සැකසේ<br>VI වන පරිච්ඡේදය - මු.රෙ.315 සිට 396 දක්වා<br>XIII වන පරිච්ඡේදය - මුදල් රෙගුලාසි 685 සිට 775 දක්වා |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගආ/ආ.ස./4/2/32
දිනය : 2018/4/11

අත්සන ..........
නම ..........නිරෝෂා දීපනී ඊශ්වර
තනතුර ..........පළාත් ඉඩම් කොමසාරිස්
නිල මුද්‍රාව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.) මාලිගාවත්ත - කොළඹ 10.

දිනය : 2018.02.05

උප ලේඛනය 05

01.විභාගයේ නම :බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරේ 1 ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය

02.විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| කළමනාකරණය | පැය 03 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි වර්ෂයකට එක් වරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේද යන්න හා ඒවා භාවිතයේදී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. |
| කළමනාකරණය | I කළමනාකරණ මූලධර්ම<br>II කළමනාකරණ ශ්‍රිතයන්<br>සැලසුම් කිරීම, තීරණ ගැනීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සංවිධානය, මාණ්ඩලිකරණය, මෙහෙයවීම, අභිප්‍රේරණ ක්‍රියාවලිය, නායකත්වය, පාලනය, පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br>III සහභාගිත්ව කළමනාකරණය<br>IV කළමනාකරණ පරිසරය<br>V සිද්ධි අධ්‍යයනය |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ........................
දිනය : ........................

අත්සන .........................................
නම .........තිරෝෂා දීපතී ඊශ්වර.........
තනතුර .........පළාත් ඉඩම් කොමසාරිස්.........
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.)
මාලිගාවත්ත - කොළඹ 10.
නිල මුද්‍රාව

දිනය : 2018.02.05

## උප ලේඛනය 06

01.විභාගයේ නම : බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරේ 1 ශ්‍රේණියේ නිලධරයන් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02.සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද<br>අදාල මූලික සුදුසුකම ඉක්මවා සපුරා ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි 1 වන ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය - එක් වසරක් වෙනුවෙන් ලකුණු 10 බැගින් | 50 | |
| කුසලතාවය - 15<br>කාර්ය සාධනය (ආසන්න වසර 05 ක) ඇගයීම් වාර්තා පදනම් කරගෙන පහත පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.<br>ඉතා හොඳයි - 03<br>හොඳයි - 02<br>ආසන්න අවුරුදු 05 ක කාලය තුලදී සිදුකර ඇති සංවර්ධන ව්‍යාපෘති වලට දක්වා ඇති දායකත්වය - 10<br>ආයතන ප්‍රධානියා සහතික කර ඇති ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කටයුතු කිරීම වෙනුවෙන් නිමකර ඇති එක් ව්‍යාපෘතියකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10 කි<br>ආසන්න අවුරුදු 05 ක කාලය තුලදී රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු සඳහා දක්වා ඇති දායකත්වය - 15<br>ආයතන ප්‍රධානියා සහතික කර ඇති වාර්තා අනුව<br>සංවිධානයකර පවත්වන ලද ජංගම සේවාවකට ලකුණු 02<br>සංවිධානයකර පවත්වන ලද ඉඩම් කච්චේරියකට ලකුණු 02<br>සහභාගි වූ ජංගම සේවාවකට ලකුණු 01<br>සහභාගි වූ ඉඩම් කච්චේරියකට ලකුණු 01<br>බැගින් උපරිම ලකුණු 15 කි<br>වෘත්තීය සුදුසුකම්<br>රජයේ ඉඩම් කළමණාකරණය හා සම්බන්ධ - 05<br>මාස 06 ක පාඨමාලා සහතිකයක් සඳහා - 02<br>මාස 06 ට අඩු පාඨමාලා සහතිකයක් සඳහා - 01 | 45 | අදාල නොවේ |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : [illegible]
දිනය : [illegible]

3. සම්මුඛ පරීක්ෂණය සඳහා පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

සකස් කලේ : ....................................

ඒ.එල්.පාලිත - කළමනාකරණ සහකාර

පරීක්ෂා කලේ : ..............................................

කේ.කේ.කේ.ෆොන්සේකා

සහකාර පළාත් ඉඩම් කොමසාරිස්

දිනය : 2018.02. 05

අත්සන ..........................................

නම ............ නිරෝෂා දීපනී ඊශ්වර

තනතුර ............ පළාත් ඉඩම් කොමසාරිස්

නිල මුද්‍රාව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප.) මාලිගාවත්ත - කොළඹ 10.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන

ගොනු අංකය : 605/WP/4/12/33

දිනය : 2018/4/12

ඇමුණුම - 1

## ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය

1. නිලධරයා පිළිබඳ තොරතුරු

   1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................

   1.2 හැඳුනුම්පත් අංකය : ..........................................................................

   1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..........................................................................

   1.4 අයත් වන ශ්‍රේණිය හා තනතුර : ..........................................................................

   1,5 අයත් වන සේවා ශ්‍රේණිය හා ශ්‍රේණිය : ..........................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

   2.1 පත්වීම් දිනය : ..........................................................................

   2.2 පත්වීම ස්ථිර කල දිනය : ..........................................................................

   2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය : ..........................................................................

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

   2.4 සමත් වූ භාෂා ප්‍රවීනතා මට්ටම හා සමත් දිනය

| | | |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාල තොරතුරු

   3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I / විශේෂ

   3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

      3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද ? ඔව් / නැත

      3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..........................................

4. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවරදි බවත්, ඉහත නම සඳහන් .......................................... .................................................................................. මහතා /මෙනවිය / මහත්මිය ........................ සේවා ශ්‍රේණයේ ...................................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : G-S/IA2/4/7/33-
දිනය : 2018/4/19

අත්සන ..................................................

නම ..................................................

තනතුර ..................................................

නිල මුද්‍රාව

දිනය:

5. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් දක්වා ඇති කරුණු නිවරදි බවත් / නිවරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

අත්සන ...............................................
නම ...............................................
තනතුර ...............................................
දිනය ....................................
නිල මුද්‍රාව

5. ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

අමාත්‍යාංශ ලේකම් විසින් දක්වා ඇති ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

අත්සන ...............................................
නම ...............................................
තනතුර ...............................................
දිනය ....................................
නිල මුද්‍රාව

6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් / පත්වීම් බලධරයා

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවරදි බවත්, ඒ අනුව ............................................... මහතා / මහත්මිය /මෙනවිය ............................................... සේවා ගණයේ ........................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ............................................ දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

ශරූ ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ........................
දිනය : 2018/..../....

අත්සන ...............................................
නම ...............................................
තනතුර ...............................................
නිල මුද්‍රාව

දිනය: